# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - අප්‍රේල් මාසය - 1 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.
ප්‍රා. ගුරු උපදේශක :- බන්දුප්‍රේම ඕපනායක

- දුවේ ,පුතේ ,ඔන්න දැන් අපි වෙසක් උත්සවයට සූදානම් වෙන්නයි යන්නේ.
- ගස්වල මල් පිපිලා.
- සමනලයින් ,මී මැස්සන් ඒ මල්වල පැණි බොන්න එනවා.
- සිදුහත් කුමාරයා ඉපදෙන විටත් ඒ වගේමයි.
- ලුම්බිණි සල් උයනම මල් වලින් පිරිලයි තිබුණේ .
- මහාමායා දේවියගේ කුසින් සිදුහත් කුමාරයා බිහිවූ විගසම ඒ කුමාරයා ඇවිදින්න පටන් ගත්තා .
- තබන තබන පියවරෙහි නෙළුම් මල් පිපුණා.
- මල් කීයක්ද පිපුණේ? පියවර හතට මල් හතක්.
- චූටි නංගිලා මල්ලිලා ඉස්සෙල්ලම ඇවිදින විට අම්මා එහෙම අත්පුඩි ගහලා මොනවද කියන්නේ?
- "හතායි හතායි " කියලා කියනවා.
- ඒ කියන්නේ සිදුහත් කුමාරයා ඉස්සෙල්ලම ඇවිදින අවස්ථාව මතක් කිරීම.
- මෙන්න මේ කවි ටිකත් පාඩම් කර ගන්න .

බෝසත් සිදුහත් කුමරා - උපන් දා වෙසක් දිනේ
ලුම්බිණියේ සල් උයනට - හරිම ලස්සනයි.

ජය සිරි මහ බෝ සෙවණේ - බුදු බව ලැබු වෙසක් දිනේ
බුද්ධගයා පින් භූමිය - හරිම සුන්දරයි.

කුසිනාරා පුරවරයේ - උපවර්තන සල් උයනේ
බුදු සමිඳුන් පිරිණි වුණේ - වෙසක් පෝය දා.

**“හොඳයි ආදරණීය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!”**